# 7 කායින් හා ආබෙල්



7.1 රූපය - කායින් හා ආබෙල් පඬුරු ඔප්පු කරන අවස්ථාව

ආදම් සහ ඒව යන දෙදෙනාට කායින් සහ ආබෙල් නම් පුත්තු දෙදෙනෙක් වූහ. ආබෙල් බැටළු එඬේරෙක් විය. කායින් ගොවියෙක් විය. කලක් ගත වූ පසු කායින් පොළොවෙන් නිපදවූ අස්වැන්න පඬුරක් වශයෙන් සමිඳාණන් වහන්සේට පූජා කළේ ය. ආබෙල් ද සිය බැටළු රැළේ කුලුඳුල් පැටවුන්ගෙන් සමහරෙකු ද ගෙන සමිඳාණන් වහන්සේට පූජා කළේ ය. සමිඳාණන් වහන්සේ ආබෙල් සහ ඔහුගේ පඬුර සතුටින් පිළිගත් සේක. එහෙත් උන්වහන්සේ කායින් සහ ඔහුගේ පඬුර නොපිළිගත් සේක. එම නිසා කායින් තදින් කිපී ආබෙල්ට ඊර්ෂ්‍යා කළේ ය. එබැවින් දෙවියන් වහන්සේ කායින්ට අවවාද කළ සේක.

සමිඳාණන් වහන්සේ ද කායින්ට කතා කොට, "නුඹ මෙතරම් කිපී, දුර්මුඛ වී සිටින්නේ මන් ද? නුඹ යහපත කරන්නෙහි නම් නුඹ පිළිගනු ලබන්නෙහි ය. නුඹ අයහපත කරන්නෙහි නම් පාපය රකුසකු සේ නුඹේ දොරකඩ ලැග සිටින්නේ ය. ඌ නුඹ මැඩලීමට බලාගෙන සිටියි; එහෙත්, නුඹට ඌ දමනය කළ හැකි ය"යි වදාළ සේක.

(උත්පත්ති 4:6-7)



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

තම සහෝදර ආබෙල් ගැන දෙවියන් වහන්සේ ප්‍රසන්න වූ බව දැන ගත් කායින් ඊර්ෂ්‍යාවෙන් පිරී කෝපයෙන් කල් ගත කළේ ය. කායින් නපුරෙන් පිරී නොමඟ යන බව දැනගත් දෙවියන් වහන්සේ අයහපත් සිතුවිලි පසෙක දමා යහපත් පුද්ගලයකු වන ලෙස ඔහුට අවවාද කළ සේක. ඔහු යහපත් වීමට උත්සාහ කළොත් දෙවියන් වහන්සේ ඔහුට උදව් වීමට ද පොරොන්දු වූ සේක.

අප වැරදි කරන විට ද දෙවියන් වහන්සේ විවිධ පුද්ගලයන් මගින් අපට ද අවවාද කරන සේක. ඒ අය නම් ආගමික නායකයන්, දෙමවුපියන්, ගුරුවරුන් හා වැඩිහිටියන් ය. අපට නිවැරදි මඟ පෙන්වන අයට අප ඇහුම්කන් දිය යුතු ය.



7.2 රූපය - කායින් විසින් ආබෙල් මරා දැමීම

කායින් සිය සොහොයුරු ආබෙල් අමතා, "අපි එළිමහනේ කෙතට යමු"යි කී ය. මෙසේ ඔවුන් ගිය විට කායින් සිය සොහොයුරු ආබෙල්ට විරුද්ධ ව නැගිට ඔහු මරා දැමී ය.
(උත්පත්ති 4:8)

කායින් තම සහෝදරයා වන ආබෙල් මරා දැමීම තුළින් අපට පෙන්නුම් කරන්නේ මිනිසා සහෝදර ප්‍රේමයට විරුද්ධ ව කටයුතු කළ ආකාරයයි. ඊර්ෂ්‍යාවෙන් පිරි කායින් සහෝදර ප්‍රේමයට පිටුපා යමින් තම සහෝදරයා මරා දැමූ ආකාරයයි. දේව දරුවන් ලෙස අප අන් අය සමඟ සහෝදර ප්‍රේමයෙන් ජීවත් විය යුතු ය. අන් අයට ඊර්ෂ්‍යා නොකළ යුතු ය. අන් අයගේ දියුණුව හමුවේ සතුටු විය යුතු ය. අන් අයගේ ජීවිත ආරක්ෂා කළ යුතු ය.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

දෙවියන් වහන්සේගේ අවවාදයට පිටුපා වරදට වැටුණු කායින්ගෙන් දෙවියන් වහන්සේ ප්‍රශ්න කළ සේක.

සමිඳාණන් වහන්සේ : ඔබේ සහෝදරයා වූ ආබෙල් කොහේ ද?

කායින් : මම නොදනිමි. මම මාගේ සහෝදරයාගේ භාරකරු ද?

සමිඳාණන් වහන්සේ : නුඹ කළ මේ දේ කුමක් ද? බලන්න, නුඹේ සහෝදරයාගේ ලේ පොළොවෙන් මට මොර ගසයි.

වරදට වැටුණු කායින්ට දුන් දඬුවම් සහ එහි ප්‍රතිඵල මෙසේ ය;

1. සාප ලද්දෙක් වීම
2. පොළොවන් නෙරපා දැමීම
3. වගා කරන විට පලදාව නොදීම
4. ගෙයක් දොරක් නැති මිහි පිට ඉබාගාතේ යන මිනිසකු වීම

දෙවියන් වහන්සේ කායින්ගෙන් ආබෙල් පිළිබඳ ව විමසූ විට ඔහු පවසන්නේ, "මම නොදනිමි" කියා ය. ඔහු බොරු කියයි. මෙයින් පෙනී යන්නේ, පාපයේ වර්ධනය හා ඒ කරණ කොටගෙන මිනිසා දරුදඬු වීම ය. හොරෙන් වරදක් කළත් දෙවියන් වහන්සේගෙන් වසන් කළ නොහැකි ය. කායින්ට දෙවියන් වහන්සේ දඬුවම් කළ ද ඔහුට දෙවියන් වහන්සේ කරුණාව දැක්වූ බව පහත වගන්තිවලින් පෙන්නුම් කරයි.

කායින් සමිඳාණන් වහන්සේට කතා කොට, "මාගේ දඬුවම දැරිය නොහැකි තරම් දරුණු ය. ඔබ මෙදින මේ පොළොවෙන් මා නෙරපාදමන සේක. මා ඔබගෙන් සැඟවී, ගෙයක් දොරක් නැති, මිහි පිට ඉබාගාතේ යන්නෙකු විය යුතු ය. මා හමුවට එන කවරෙක් වේ වා, මා මරා දමනු ඇතැ"යි කීය. එහෙත්, සමිඳාණන් වහන්සේ උත්තර දෙමින්, එසේ නොවනු ඇත. යම් කෙනෙක් කායින් මැරුවොත් ඔහුගෙන් එමෙන් සත් වරක් දරුණු ලෙස, පළිගනු ලබන්නේ ය"යි වදාළ සේක. එබැවින් සමිඳාණන් වහන්සේ ද යමෙකුට කායින් මුණ ගැසුණොත් කායින් නොමරන පිණිස ඔහු පිට ලකුණක් තැබූ සේක.

(උත්පත්ති 4:13-15)

ඉහත බයිබල් පාඨයට අනුව යම් කෙනෙක් කායින් ව මැරුවොත් ඔහුගේ දඬුවම එමෙන් සත් වරක් දරුණු බව පවසයි. මෙයින් පෙන්නුම් කරන්නේ වරදකරුවාගේ පවා ජීවිතයේ අයිතිය දෙවියන් වහන්සේ සතු බව ය. අනුන් විනිශ්චය කිරීමට අපට

අයිතියක් නැත. සමිඳාණන් වහන්සේ කායින් පිට තැබූ "සලකුණ" දණ්ඩනයේ නොව දේව රැකවරණයේ ලාංඡනයකි. මෙයින් අපට පෙන්නුම් කරන්නේ, ස්වාමීන් වහන්සේ වෙත හැරී කන්නලව් කරන පව්කාරයාට පවා උන්වහන්සේ දයා කරුණාව දක්වන බව ය. අප සැම විට ම පාපයෙන් ඈත් විය යුතු ය. ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, මිනී මැරීම ආදියෙන් අප ඈත් විය යුතු ය. අපි සැම විට ම සහෝදර ප්‍රේමයෙන් ජීවත් විය යුතු වෙමු.

## ක්‍රියාකාරකම

1. කායින් ආබෙල් කථා පුවත තුළින් ඔබේ ජීවිතයට ගත හැකි මඟ පෙන්වීම් **තුනක්** ලියන්න.
2. අප වැරදි කරන විට අපට මඟ පෙන්වීම් ලබා දෙන පුද්ගල කාණ්ඩ **හතරක්** නම් කරන්න.
3. ඊර්ෂ්‍යාව ජය ගැනීමට කළ හැකි කාර්ය **තුනක්** ලියන්න.

### ජීවිතයට බිඳක්

★ *අන් අයට ඊර්ෂ්‍යා නොකරන්න.*

★ *අපට නිවැරැදි මඟ පෙන්වන අයට ඇහුම්කම් දෙන්න.*

★ *සැම විට ම සහෝදර ප්‍රේමයෙන් ජීවත් වෙන්න.*



නොමිලේ බෙදාහැරීම සඳහා ය.